# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2358/12 - 2023 නොවැම්බර් මස 13 වැනි සඳුදා - 2023.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* ARA/LND/ACQVI/D3/47.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ අංකය:* 4-3/15/2017/VE/321.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 33 සී රුවන්දෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පල්ලේ පමුණුව ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2020.09.21 දිනැතිව පිළියෙල කරන ලද අංක මු. පි. කෑ 3762 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1856 පමණ වූ වීදියමංකඩ හේන නැමැති ඉඩම.

01. කැබලි අංක 01

ඉඩමේ නම: වීදියමංකඩ හේන ; විස්තරය: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා දෙවනගල, පල්ලේ පමුණුව පදිංචි විජේසිංහ වාසලතිලකගේ නාලනී සේනාරත්න, දෙවනගල, පල්ලේ පමුණුව පදිංචි විජයරත්න අර්ථනායක ධම්මධවජජ පණ්ඩිත මොහොට්ටලැගේ සමන් අනුරුද්ධ විජේරත්න, මහනුවර අම්පිටියේ පදිංචි විජයරත්න අර්ථනායක ධම්මධවජජ පණ්ඩිත මොහොට්ටාල මුදියන්සේ රාළහාමිලෑ සරත් ගාමිණී විජයරත්න මොහොට්ටාල, පිළිමතලාව පමුණුව පදිංචි වික්‍රම ආරච්චිගේ කල්‍යාණී චන්ද්‍රිකා අබේවික්‍රම සහ දෙවනගල පල්ලේ පමුණුව පදිංචි හේරත් පතිරණගේ දර්ශන සුමනසිංහ අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්: 0.1856.

*උතුරට* : තානායම්වත්ත සහ කෑ 3555 වැනි මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: කෑ 3555 වැනි මූලික පිඹුරේ 1 සහ 5 වැනි බිම් කැබලි; *දකුණට* : කෑ 3555 වැනි

මූලික පිඹුරේ 5 වැනි බිම් කැබැල්ල සහ මහඔය ; බටහිරට : මහඔය සහ තානායම්වත්ත.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 දෙසැම්බර් මස 21 වැනි දින පෙ.ව. 10.00 ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2023 දෙසැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

වී. ඕ. එල්. එස්. රත්නසේකර,
ප්‍රාදේශීය ලේකම්/
අරණායක.

2023 නොවැම්බර් මස 08 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11-0133

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* ARA/LND/ACQVI/D3/71.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ අංකය:* 4-3/18/2019/WS/526.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්බොඩ කෝරළේ (බටහිර) අංක 43 ඩී, පෝඩාපේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පෝඩාපේ ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2023.10.23 දිනැතිව පිළියෙල කරන ලද අංක කැඩැස්තර සිතියම් අංකය 610411 දරන සිතියමේ කැබලි අංක 01, 02 හා 03 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0981 පමණ වූ ඉඩම් සඳහා මායිම්;

**කැබලි අංක 01**
ඉඩමේ නම: වෙලන්තලාවේහේන, ගොඩමඩිත්තේ කොටුව; විස්තරය: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම්පාන්නා: ඩබ්ලිව් ගාමිණී උදය කුමාර අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්: 0.0095.

උතුරට: මාර්ගය; නැගෙනහිරට: කැබලි අංක 2 සහ 3; දකුණට: කැබලි අංක 2, 3 සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: වෙලන්තලාවේ වත්ත *හෙවත්* මීගහමුල හේන සහ මාර්ගය

**කැබලි අංක 02**
ඉඩමේ නම: අගලමුලහේනේ මුකලාන *නොහොත්* මහකොස්ගහමුල හේන, ගොඩමඩිත්තේ කොටුව; විස්තරය: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම්පාන්නා: ඩබ්ලිව් ගාමිණී උදය කුමාර අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්: 0.0830.

උතුරට: කැබලි අංක 1, මාර්ගය සහ මු පි 2858 හි කැබලි අංක 1; නැගෙනහිරට: මු.පි. 2858 හි කැබලි අංක 1, මාර්ගය සහ මෙම පිඹුරේ කැබලි අංක 3; දකුණට: මාර්ගය, මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරි) සහ කැබලි අංක 3; බටහිරට: කැබලි අංක 3 සහ 1.

**කැබලි අංක 03**
ඉඩමේ නම: අගලමුලහේනේ මුකලාන *නොහොත්* මහකොස්ගහමුල හේන, ගොඩමඩිත්තේ කොටුව; විස්තරය: අරණායක අම්බලකන්ද ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා අවශ්‍ය වී ඇත. මු. පි. 2858 හි 2 වැනි කැබැල්ලේ කොටසක් (මාර්ගය සඳහා වෙන්කළ බිම); ප්‍රමාණය: හෙක්: 0.0056.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 දෙසැම්බර් මස 14 දින පෙ.ව. 10.00ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2023 දෙසැම්බර් මස 07 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී. ඕ. එල්. එස්. රත්නසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2023 නොවැම්බර් මස 08 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අරණායක.

EOG 11-0134

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: HRP/LND/ACQSN/12/05-V.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/9/2014/අයිආර්/348ඡ්.

අංක 2078/3 හා 2018.07.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයෙහි ඉඩමේ විස්තරයෙහි 2A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි කැබලි අක්ෂර 10 හි හිමිකම් කියන අය "රජය" යන්න "රජය, පුහුදිවුල, කපුගොල්ලෑව පදිංචි සරාගේ අබේසිංහ" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. කේ. ජී. මොරවක,
ප්‍රාදේශීය ලේකම්,
හොරොව්පොතාන.

2023 නොවැම්බර් මස 09 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල යේ දී ය.

EOG 11-0136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.